# 2022 පෙබරවාරි මාසයට අදාලව 2022.02.22 දින පවත් වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2022.02.22
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගීත්වය -**

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 11. ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 12. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

## පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

2022.01.20 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.02.15 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2022.01.20 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

## 2.1. පවතින විදුලි අර්බුදය හමුවේ වීථි ලාම්පුවල ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම සහ බලශක්ති සංරක්ෂණය වන ආකාරය සිදු කිරීම සම්බන්ධවයි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් රටේ පවතින විදුලි අර්බුදය නිසා අනවශ්‍ය වීථි ලාම්පු ඉවත් කිරීම සිදු කිරීම , වීථි ලාම්පු දැල්වෙන කාලය දිනයක ප.ව.7.00 සහ පසු දින පෙ.ව.5.00 දක්වා පමණක් බව දන්වා ඇති අතර ඔබ ප්‍රදේශයේ වගකීම් විරහිතව සිටින පිරිස් පිළිබඳ ලේකම්තුමාව දැනුවත් කර වීථි ලාම්පු අංශයේ සිටින වසන්ත මහතා හරහා තොරතුරු රැගෙන එසේ අනවශ්‍ය ලෙස විදුලිය භාවිත කරන පුද්ගලයන්ට

අවවාද කර එසේත් නොකරන්නේ නම් එවැනි වීපී ලාම්පු ගලවා ඉවත් කිරීමට බලාපොරොත්තුවන බව නිවේදනය කළේය.

## **2.2.** 2022 ජනවාරි මාසය තුල කොවිඩ් ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය සම්බන්ධ වාර්තාව .

2022 ජනවාරි මාසය තුල බිබිල ප්‍රදේශය තුල සැලකිය යුතු ලෙස කොවිඩ් ආසාධිත රෝගීන් ප්‍රමාණය අඩුවීමක් දක්නට ලැබුන අතර බිබිල සෞඛ්‍ය නිලධාරි කාර්යාලය හරහා ලැබුණු වාර්තාවන්ට අනුව නිවෙස් වල නිරෝධායනය වන රෝග ලක්ෂණ සහිත ආසාධිත කොවිඩ් රෝගීන් 37කට අවශ්‍ය ආයුර්වේද ඖෂධ හා ප්‍රතිශක්ති වර්ධක ඖෂධ ඔවුන්ගේ නිවෙස් වෙතටම ලබාදුන් රෝගීන්ගේ ලේඛනය පහත දැක්වේ.

| දිනය | රෝගීන් ප්‍රමාණය |
|---|---|
| 2022.01.10 | 01 |
| 2022.01.13 | 04 |
| 2022.01.19 | 02 |
| 2022.01.24 | 09 |
| 2022.01.25 | 21 |
| **මුළු එකතුව** | **37** |

පුද්ගල ශරීරය තුල ප්‍රතිශක්තිය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම අරමුණු කරගෙන ජනවාරි මාස තුල පමණක් සුවධරණී පේයාව කි.ග්‍රෑ.3.4ක ප්‍රමාණයක් බෙදා දෙන ලදී. බිබිල ප්‍රාදේශීය සභා ආයුර්වේද බෙහෙත් ශාලාවේ පැවැත්වෙන කොවිඩ් පසු ප්‍රතිකාර සායනය හරහා කොවිඩ් ආසාධිතව නියමිත නිරෝධායන කාලය අවසන් වූවද විවිධ වූ අතුරු ආබාධවලින් පෙලෙමින් සිටින රෝගීන් හට තව දුරටත් ප්‍රතිකාර ලබා දෙන බව නිවේදනය කළේය.

## **03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

### **ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා**

බිබිල ,ශ්‍රී බෝධිරුක්ඛාරාමය, බිබිල ශාසනාරක්ෂක බල මණ්ඩලය, පූජ්‍ය දොඩම්ගොල්ලේ සෝරත ස්වාමින් වහන්සේ විසින් බිබිල නගරයේ ජුම්මා පල්ලිය,කොටබොවේ ඉදිවෙන පල්ලිය හා බිබිල රතුපස්කැටිය ග්‍රාම සේවා වසමේ ඉරිදා දිනයක ජනතාව පීඩාවට පත්වන පරිදි යාඤ්ඤා මඩුවක් පවත්වාගෙන යාමත් මෙම ස්ථාන නීත්‍යානුකූල නොවන ආකාරයෙන් සාදා ඇති බවත් ප්‍රකාශ කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර මෙහි දී ආගමක් ඇදහීම පාලනයක් කළ නොහැකි බැවින් නීති රාමුව අභිබවා ඊට පටහැනිව කටයුතු කර ඇත්නම් එයට දිය හැකි සහයෝගය ලබා දීමටත් ලබන සභා වාරයේ දී ස්වාමින් වහන්සේ කැඳවීම සුදුසු බව ප්‍රකාශ කරමින් ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා විසින් මෙම ලිපිය සභාගත කරන ලදි.

### **ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා**

බිබිල,යල්කුඹුර,කොලොන්ගොල්ල ලිපිනයේ පදිංචි කේ.එල්. සන්ධ්‍යා මල්කාන්ති ඇතුළු ගම් වාසීන් විසින් කිවුලේ අරාව කොලොන්ගොල්ල ගමෙහි පවුල් දහයක් පමණ පානීය ජලය පිළිබඳ ගැටලුවකට මුහුණ ඇති බැවින් මින් පෙරද ලිඛිතව ඉල්ලුම් කර තිබුනද මේ වන තුරු එයට විසඳුමක් ලබා දී නොමැති බැවින් එය සිදු කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා විසින් සභාගත කරන ලදි.

**ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා**

බිබිල,වැගම, 02 කණුව, කුඩුම්රහාවත්ත ලිපිනයේ පදිංචි ගම්වාසීන් විසින් කුඩුම්රහාවත්ත ප්‍රධාන මාර්ගයේ සිට නිවාස 08ක් පමණ ඇති බැවින් මීටර් 200ක අතුරු මාර්ගයක් තිබෙන අතර එම මාර්ගය ගල් අල්ලා පිලිසකර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාගත කරන ලදි.

බිබිල, වැගම,රන්තරු පෙර පාසලෙහි එච්.එම්.රේණුකා යන පාලිකාව විසින් ළමා පුටු සහ ළමා මේස 35 දෙනෙක්ට පමණක් ඇති බවත් දැනට මෙහි දරුවන් 60 දෙනෙකු සිටින බැවින් ඉතිරි දරුවන් සඳහා ළමා පුටු සහ ළමා මේස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාගත කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා**

බිබිල,පිටකුඹුර,තොටිල්ලකැටිය ස්ව ශක්ති ප්‍රජා මූල සංවිධානය විසින් එම ප්‍රජා ශාලාවට පොදු වැසිකිලි පහසුකම් නොමැති බැවින් ඒ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර අවශ්‍යා මුදල් ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සභාගත කරන ලදි.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා.

### 05.01.01.පොදු වෙළඳපොල කඩ කාමර සඳහා නව තක්සේරු මුදලක් අය කිරීම.

බිබිල,මහියංගන පාර, දැවැන වත්ත, යන ලිපිනයේ පදිංචි එච්.එම්.චන්ද්‍රරත්න අය විසින් ඔහුගේ කඩකාමරය ඉදිරිපිට ඩෝසර්,විශාල ටිපර් රථ, දිග ලොරි රථ, ටේලර් සහිත ට්‍රැක්ටර්, වෑන් රථ, ලොරි රථ නවතා තිබීම හේතුවෙන් හා කොවිඩ් වසංගත තත්වය නිසා ද පාරිභෝගිකයන්ගේ පැමිණීම අවම වීම හේතුවෙන් වෙළදාම අඩු වී ඇති බවත් මෙවන් අසීරු තත්වයකදී එක්වරම කඩ කුලිය රු.13,750.00 සිට රු.19,000.00 දක්වා වැඩි කිරිමෙන් එය ගෙවීම අසීරු බවත් දැනට ගෙවාගෙන යන රු.13,750.00 කුලිය ඉදිරියටද ගෙවාගෙන යාමට අවස්ථාව දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. මොහුගේ අපහසුතාවය පිළිබඳ සලකා බලා රු.13,750.00ක මුදල ඉදිරියටත් ගෙවා ගෙන යාමට අවස්ථාව සලසා දීම සුදුසු බවත් එම මුදල සංශෝධනය කිරිම සිදු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යැවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන තක්සේරු මුදල අධිකරණයටවත් වෙනස් කළ නොහැකි බවත් ඉතිහාසයේ සිට මේවන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වෙනස් කර නොමැති බවත් ජනතාවගේ ඉල්ලීම් සලකා බලා නැවත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නැවත සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක්

කිරීමටත් එතෙක් රු.19,000.00ක මුදල අයකිරීමටත් එය සංශෝධනය වූවහොත් ඉදිරියට හිලව් කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන තක්සේරු මුදල අධිකරණයටවත් වෙනස් කළ නොහැකි බවත් ඉතිහාසයේ සිට මේවන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වෙනස් කර නොමැති බවත් ජනතාවගේ ඉල්ලීම් සලකා බලා නැවත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නැවත සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කිරීමටත් එතෙක් රු.19,000.00ක මුදල අයකිරීමටත් එය සංශෝධනය වූවහොත් ඉදිරියට හිලව් කිරීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.02. රටේ පවතින කොරෝනා වසංගත තත්වය නිසා අංක 02 දරණ මුහුදු මාළු වෙළඳසැල හා මිරිදිය මාළු වෙළඳසැල වසා තිබූ කාලය සඳහා අයකරන බදු මුදල් සහනයක් ලබාදීම.</u>

බිබිල, රතුපස්කැටිය ,ගල්ගේලන්ද පාර ලිපිනයෙහි පදිංචි එම්.ඒ.ඉෂාර ධනංජය යන අය විසින් ඔහුගේ බිරිඳට හා දියණියට කොරෝනා වසංගතය වැලඳීම හේතුවෙන් අංක 02 දරණ මුහුදු මාළු වෙළඳසැල හා මිරිදිය මාළු වෙළඳසැල 2021.11.04 දින සිට 2021.11.20 දක්වා වසා තිබීම හේතුවෙන් මෙම වෙළඳසැලෙන් අයකරනු ලබන බදු මුදල සඳහා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ සමඟ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ සහතිකයද ඉදිරිපත් කර ඇති බැවින් එය සලකා බලා වෙලඳසැල් වසා තැබූ කාලය සඳහා බදු ගාස්තුව නිදහස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී දවස් 15කට බදු ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දවස් 15කට බදු ගාස්තුව නිදහස් කිරීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03. රතුපස්කැටිය ග්‍රාමයෙහි ජල ව්‍යාපෘතියේ ජල ටැංකිය සම්බන්ධවයි.

බිබිල, රතුපස්කැටිය ලිපිනයෙහි පදිංචි එච්.එම්.ලලිත් කුමාර මයා විසින් බිබිල රතුපස්කැටිය ග්‍රාමයෙහි ජල ව්‍යාපෘතිය(විජයමුණි සොයිසා ජල ව්‍යාපෘතිය) මගින් ඉදි කර ඇති ජල ටැංකිය ඔහුගේ පදිංචි ඉඩමේ ස්ථාපිත කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා ඔහු වෙත මසකට රු.7,000.00ක පමණ මුදලක් ලබා දුන් බවත් මෙම ජල ටැංකිය පාලන කටයුතු හා අයිතිය බිබිල ප්‍රාදේශීය සභාව වෙත පවරා දී ඇති අතර ප්‍රාදේශීය සභාවට මෙම ව්‍යාපෘතිය භාර ගැනීමෙන් පසු ඔහු වෙත ප්‍රාදේශිය සභාව විසින් මේ දක්වා කිසිදු මුදලක් ගෙවා නොමැති බවත් ඔහු වෙත මාසිකව රු.10,000.00ක මුදලක් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. එය සලකා බලා මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී එම ඉඩම් සම්බන්ධයෙන් නීතිමය ගැටළුවක් ඇති බැවින් අවශ්‍ය කරන නීතිමය ලියකියවිලි ඉදිරිපත් කිරීමටත් එම ලියකියවිලි ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමටත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබේ නම් ගෙවීම් කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉඩම් සම්බන්ධයෙන් නීතිමය ගැටළුවක් ඇති බැවින් අවශ්‍ය කරන නීතිමය ලියකියවිලි ඉදිරිපත් කිරීමටත් එම ලියකියවිලි ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමටත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබේ නම් ගෙවීම් කිරීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. වැලි කැණීම් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගංගා ඇළ ඉවුරු ආශ්‍රිතව වැලි කැණීම් කටයුතු සිදුකරගෙන යන බොහෝ පිරිසක් සිටින බැවින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 60(1) වගන්තියෙන් දැක්වෙන යම් දේපලකට අලාභ හානි සිදු නොවන අයුරින් වැලි කැණීම් කටයුතු කිරීමටත්, ගංගා ඉවුරු හරහා ඉදිකර ඇති පාලම්, කෝසු, බොක්කු, පැති බැම් ආදී ඉදිකිරීම් සිදු කර ඇති ස්ථානයේ සිට දෙපසට මීටර් පන්සීයක (500m) දුරකින් කැණීම් කටයුතු සිදුකිරීමටත්, අවසර ලබාදීම සුදුසු බවත්, එසේ අලාබ හානියක් සිදුකලහොත් 1987 අංක 15

දරණ ප්‍රාදේශීය සභා පනතේ 60 වගන්තිය පරිදි දඩ මුදලක් නියම කිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා මෙයට එකඟ නොවන බවත් මෙය කිලෝමීටර් 01ක් නම් එයට එකඟ වන බවත් ප්‍රකාශ කරන ලදී.එහි දී වැලි කැණීම් කටයුතු කිරීමට, ගංගා ඉවුරු හරහා ඉදිකර ඇති පාලම්, කෝසු, බොක්කු, පැති බැම් ආදී ඉදිකිරීම් සිදු කර ඇති ස්ථානයේ සිට ගංගා හා ඇළ ඉවුරේ ඉහලට මීටර් 500ක් හා පහළට කිලෝමීටරයක දුරක් දැමීමටත් දැනට පවතින වැලි කැණීම් කටයුතු සිදුකරගෙන යන ස්ථාන දීර්ඝ කාලීනව පවත්වාගෙන ආ බැවින් පරිසරයට හානියක් නොවන ආකාරයෙන්ම පවත්වාගෙන යාමටත් අලුතින් ආරම්භ කරන ස්ථාන සඳහා ඉහත ආකාරයට කටයුතු කිරීමටත් සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වැලි කැණීම් කටයුතු කිරීමට, ගංගා ඉවුරු හරහා ඉදිකර ඇති පාලම්, කෝසු, බොක්කු, පැති බැම් ආදී ඉදිකිරීම් සිදු කර ඇති ස්ථානයේ සිට ගංගා හා ඇළ ඉවුරේ ඉහලට මීටර් 500ක් හා පහළට කිලෝමීටරයක දුරක් දැමීමටත් දැනට පවතින වැලි කැණීම් කටයුතු සිදුකරගෙන යන ස්ථාන දීර්ඝ කාලීනව පවත්වාගෙන ආ බැවින් පරිසරයට හානියක් නොවන ආකාරයෙන්ම පවත්වාගෙන යාමටත් අලුතින් ඉදි වන ස්ථාන සඳහා ඉහත ආකාරයට කටයුතු කිරීමට සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05.පොදු වෙළඳපොල B 36 කඩ කාමරය තිබූ ස්ථානයේ බිම් කොටස සම්බන්ධවයි.

බිබිල, නාගල, පිං බෝධිය අසල, ශ්‍රියාවාස ලිපිනයේ පදිංචි බී.ඒ.නන්දදාස අය විසින් බිබිල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳ පොල B 36 කඩ කාමරය තිබූ ස්ථානයේ බිම් කොටස ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එය සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී එම බිම් කොටස තාවකාලික බදු ගිවිසුම මත ලබා දීමටත් කී මනි මුදල ලෙස රු.100,000.00ක් අයකිරීමටත් වර්ග අඩි ගණන බලා මාසික කුලිය අය කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

තාවකාලික බදු ගිවිසුම මත මෙම බිම් කොටස ලබා දීමටත් කී මනි මුදල ලෙස රු.100,000.00ක් අයකිරීමටත් වර්ග අඩි ගණන බලා මාසික කුලිය අය කිරීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.06.නායකඳුර ජල යෝජනා ක්‍රමයේ ජලනල එළිමේ ව්‍යාපෘතිය.**

බිබිල ප්‍රාදේශිය සභාවට අයත් නායකඳුර ජල යෝජනා ක්‍රමයේ ජල නල ඇතිරීම ව්‍යාපෘතියේ කටයුතු ඔමැට් ඉංජිනියරින් ආයතනය සමඟ 2018.12.14 දිනැතිව ගිවිසුම් අත්සන් කොට මේ දක්වා සිදු කරගෙන යනු ලබන අතර බදුල්ල වෙන්කලාඩි මාර්ග සංවර්ධන කටයුතු වලට සමගාමීව මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කරගෙන යනු ලබයි. ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව මූලික අධික්ෂණ කටයුතු බිබිල ප්‍රාදේශිය සභාවේ වැඩ අධිකාරි ලෙස සේවය කරන ලද ආර්.ඇම්.තිලකරත්න මහතා විසින් සිදු කරගෙන යන ලදි. නමුත් වැඩ අධිකාරි ආර්.ඇම්.තිලකරත්න මහතා විශ්‍රාම ගැනීමෙන් පසු ව්‍යාපෘතියේ අධික්ෂණ කටයුතු බිබිල ප්‍රාදේශිය සභාවේ කාර්මික නිළධාරි ටි.අර්.එම්.සුලෝචනා සෙනෙවිරත්න මිය විසින් සිදු කරනු ලැබුවද ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරිවරයෙක් නොමැති බැවින් පළාත් පාලන දෙපාර්තමේනතුවේ ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරිවරයෙක් ලෙස කටයුතු කරන බී.එම්.පූජිත ගුණසේකර මයා ඒ සඳහා පත් කර ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.07.වරිපනම් බදු වලින් නිදහස් කරදෙන ලෙසට ඉල්ලීම් කර ඇති අඩු ආදායම් ලාභීන්ගේ හිඟ බදු මුදල් කපා හැරීම හා 2022 වර්ෂයේ සිට වරිපනම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සඳහා.**

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු සීමාව තුළ වරිපනම් බදු ගෙවන පහත සදහන් බදු කරුවන් 06 දෙනා වරිපනම් බදු වලින් නිදහස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

01.ටී.එම් ඩිංගිරිබංඩා මයා -බදුල්ල පාර
02.ටී.එම් ආරියදාස මයා -බදුල්ල පාර
03.ටී.එම් කරුණාරත්න මයා -බදුල්ල පාර
04.එන්.ජී මැණික්හාමි මිය -මොනරාගල පාර

05.ඩබ්.ඩී පොඩිනෝනා මිය -මොනරාගල පාර
06.පී.ඩී බේබි නෝනා මිය -මොනරාගල පාර

මෙම බදුකරුවන් 06 දෙනා අඩු ආදායම් ලාභීන් / රෝගීන් බවට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර ඇත. ඒ අනුව ආදායම් පරීක්ෂක නිළධාරී මහතා මේ පිළිබඳව පරීක්ෂාකර බදුකරුවන් 06 දෙනා නිදහස් කිරීමට සුදුසු බවට වාර්තා කළ අතර තොරතුරු ඇතුළත් උපලේඛනය මේ සමඟ යොමු කරන අතර හිග වරිපනම් බදු වලින් නිදහස් කිරීමත් මොවුන්ගේ නම් ලේඛනවලින් ඉවත් කිරීමත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **<u>05.01.08.තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම.</u>**

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය මගින් සිදු කරන ව්‍යාපෘති සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස පහත නිලධාරීන් පත් කිරීම සුදුසු බව 2021.12.28 දිනැති සභාවේ 05.01.28 යෝජනාවට අනුව ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| ජේ.එම්.ජී.ඉඳුනිල් මයා | - | දිස්ත්‍රික් ඉංජිනේරු |
| බී.එම්. පූජිත ගුණසේකර මයා | - | ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරි |
| ටි.ආර්.එම්. සුලෝචනා සෙනෙවිරත්න මිය | - | කාර්මික නිලධාරි ප්‍රාදේශීය සභාව බිබිල |
| ඩබ්.ජේ.එල්.කේ.කුමාර මයා | - | සංවර්ධන නිලධාරි ප්‍රාදේශීය සභාව බිබිල |
| කේ.එච්.එම්.කාන්චනා සුරංගනී මිය | - | සංවර්ධන නිලධාරිනි ප්‍රාදේශීය සභාව බිබිල |

ඉහත සඳහන් නිලධාරීන්ට අමතරව මෙම තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා ශබ්ද විකාශන පද්ධති සවි කිරීමට අදාල කටයුතු සිදු කිරීම සඳහා,
යූ.පී.පල්ලේ කුඹුර මයා -විදුලි ඉංජිනේරු, රන්දෙනිගල විදුලි බලාගාරය,රන්දෙනිගල
ජල නල උපකරණ හා සම්බන්ධ වෙනත් කටයුතු සඳහා ,
ඩී.එම්.එස්.දිසානායක මයා -ඉංජිනේරු යාන්ත්‍රික, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, මොනරාගල
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සඳහා,
ජී.එම්.ගීතික නෙළුම් මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය,ඌව පළාත් සභාව, බදුල්ල
යන නිලධාරීන් පත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **<u>05.01.09.මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම.</u>**

මෙම සභාවේ සිටින සියළුම මන්ත්‍රීවරුන් මාසික රැස්වීමේදී තම අදහස් දැක්වීම සඳහා කාලය වෙන් කිරීමේ දී සභා රැස්වීමට වඩා කාලයක් අදහස් දැක්වීම සඳහා ගත වන බැවින් කාලය

කළමනාකරණය කර ගැනීමේ පියවරක් වශයෙන් මින් ඉදිරියට පහත සඳහන් ආකාරයට කාලය වෙන් කිරීමට අදහස් කරමි.

ඒ අනුව එක් සභා වාරයකදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් සඳහාත් විපක්ෂයේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් සඳහා විනාඩි 05 බැගින් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සුදුසු බවත් අදහස් දැක්වීමට අපේක්ෂා කරන මන්ත්‍රීවරුන් දින 07කට පෙර අදාල මාතෘකාව පිළිබඳ විස්තර සභා ලේකම් වෙත ඉදිරිපත් කර න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමටත් එය රීතියක් ලෙස පවත්වාගෙන යාමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් එක් සභා වාරයකදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් සඳහා විනාඩි 15ක්, එක්සත් ජාතික පක්ෂය සඳහා විනාඩි 05ක්, එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහා විනාඩි 05ක්, ජනතා විමුක්ති පෙරමුණ සඳහා විනාඩි 05ක් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එක් සභා වාරයකදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙහි මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් සඳහා විනාඩි 15ක්, එක්සත් ජාතික පක්ෂය සඳහා විනාඩි 05ක්, එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහා විනාඩි 05ක්, ජනතා විමුක්ති පෙරමුණ සඳහා විනාඩි 05ක් ලබා දීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10.පොදු වෙළඳපොල කඩ කාමර සඳහා නව තක්සේරු මුදලක් අය කිරීම.

බිබිල,මඩකලපුව පාර,උදාර නිවස ලිපිනයෙහි පදිංචි තිලකා ගාම්භීර යන අය විසින් පොදු වෙළඳපල අංක A-09 දරන කඩ කාමරය බදු ගෙන ඇති අතර කොවිඩ් වසංගත තත්වය නිසා පාඩු ලබමින් ඇති බවත් 2022 වසරේ දී එක්වරම කඩ කුලිය රු.13,750.00 සිට රු.19,000.00 දක්වා වැඩි කිරිමෙන් එය ගෙවීම අසීරු බවත් දැනට ගෙවාගෙන යන රු.13,750.00 කුලිය ඉදිරියටද ගෙවාගෙන යාමට අවස්ථාව දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඇයගේ අපහසුතාවය පිළිබඳ සලකා බලා රු.13,750.00ක මුදල ඉදිරියටත් ගෙවා ගෙන යාමට අවස්ථාව සලසා දීම සුදුසු බවත් එම මුදල සංශෝධනය කිරිම සිදු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යැවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන තක්සේරු මුදල අධිකරණයටවත් වෙනස් කළ නොහැකි බවත් ඉතිහාසයේ සිට මේවන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වෙනස් කර නොමැති බවත් ජනතාවගේ ඉල්ලීම් සලකා බලා නැවත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නැවත ගාස්තු සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කිරීමටත් එතෙක් රු.19,000.00ක මුදල අයකිරීමටත් එය සංශෝධනය වූවහොත් ඉදිරියට හිලව් කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන තක්සේරු මුදල අධිකරණයටවත් වෙනස් කළ නොහැකි බවත් ඉතිහාසයේ සිට මේවන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වෙනස් කර නොමැති බවත් ජනතාවගේ ඉල්ලීම් සලකා බලා නැවත තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නැවත ගාස්තු සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් කිරීමටත් එතෙක් රු.19,000.00ක මුදල අයකිරීමටත් එය සංශෝධනය වූවහොත් ඉදිරියට හිලව් කිරීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11.වොලිබෝල් ක්‍රීඩාව සඳහා අවශ්‍ය විදුලි ආලෝකකරණ උපකරණ ලබා ගැනිම සම්බන්ධවයි .

බිබිල, අඹගොල්ල, සිංහපුර, සිහින තරු ක්‍රීඩා සමාජය විසින් රාත්‍රී කාලයේ දී වොලිබෝල් ක්‍රීඩා පුහුණු කටයුතු කිරීම සඳහා ආලෝකය නොමැති නිසා ඒ සඳහා අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම් සාධාරණ බැවින් එය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීමෙන් පසු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දෙන්නේ නම් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීමෙන් පසු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දෙන්නේ නම් ලබා දීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.12. නව වෙළඳ සංකීර්ණයේ පඩි පේළිය යට ස්ථාන තාවකාලිකව බදු දීම හා ඒ සඳහා ගිවිසුම අනුමත කිරිම.</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු නව වෙළඳ සංකීර්ණයේ පඩි පේළි යට ස්ථාන වෙළඳාම් කිරීම සඳහා බදු දීමට 2022.01.20 දින ගරු සභාවේ අනුමැතිය පරිදි පහත සඳහන් අයට බදු ලබා දීම සඳහා සකස් කළ ගිවිසුම හා බදු ලබා ගැනීමට ලිපි ඉදිරිපත් කළ අය සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | බදුගත් අයගේ නම් |
|---|---|---|
| 01 | බිබිල බස් නැවතුම්පල පඩිපේළිය යට | කේ එම් නිලන්ත සංජය කුමාර |
| 02 | පලමු ගොඩනැගිල්ලේ දකුණුපස පඩිපේළිය අසල | දැල මහගමගේ මිතිල මදුෂංක රාජපතිරණ |
| 03 | පලමු ගොඩනැගිල්ලේ පඩිපේළිය යට | කපුකොටුවේ මුදියන්සේලාගේ ආරියදාස |
| 04 | වම්පස පඩිපේළිය අසල | හේරත් මුදියන්සේලාගේ සිරිපාල |
| 05 | දෙවැනි ගොඩනැගිල්ලේ දකුණු පස පඩිපේළිය අසල | රත්නායක මුදියන්සේලාගේ අනුර ජගත් බණ්ඩාර |

<u>**බිබිල නගරයේ අවහිරයක් නොමැති ස්ථාන වෙළඳාම් කිරීම සඳහා තාවකාලිකව බදුදීම.**</u>

බිබිල ප්‍රාදේශීය සභාව විසින් බිබිල නගරයේ ස්ථාන තාවකාලිකව බදුදීම අනුව ..................... ................................................................................................................ වන මා බිබිල නගරයේ.................................................................................................................
යන ස්ථානය තාවකාලිකව වෙළඳාම් කටයුතු සිදුකිරිම සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ලබා ගැනීමට පොරොන්දු වෙමි.

කොන්දේසි,

**01.** බිබිල ප්‍රාදේශීය සභාව විසින් තාවකාලිකව වෙළඳාම් කිරිම සඳහා ලබාදෙන ස්ථානය වෙළඳාම් කිරිම සඳහා සැකසීම බිබිල ප්‍රාදේශීය සභාවේ උපදෙස් මත කළයුතුයි.
**02.** තාවකාලිකව භාවිතා කරන ස්ථානය වෙනුවෙන් මාසික කුලී මුදල රු. ......................... වේ.
**03.** බදුදෙන අවස්ථාවේ තීරණය කරනු ලබන මුලික මුදලක් හා ආරක්ෂිත ඇප තැන්පත් මුදලක් බිබිල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතුයි.

**04.** මාසික කුලී මුදල අභිමතය අනුව වෙළඳ පොළ වටිනාකම අනුව සංශෝධනය කිරීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුවේ.

**05.** සෑම මාසකම 10 වන දිනට ප්‍රථම කුලී මුදල බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවා ලදුපත ලබාගත් යුතුයි.

**06.** මෙම වෙළඳ අයිතිය අන් අයෙකුට පැවරීම තහනම් වේ.

**07.** වෙළඳ අයිතිය අන් අයෙකුට පැවැරුවහොත් එදිනම සිට බදු අයිතිය අහෝසි වන අතර, තැන්පත් මුදල හා ආරක්ෂිත ඇප තැන්පත් මුදල සභාව සතුවේ.

**08.** පරිසරය අපවිත්‍ර කිරීමෙන් වැලකී සිටීමට වගබලා ගත යුතුයි.

**09.** බිබිල ප්‍රාදේශීය සභාව විසින් දැනුම් දෙනු ලබන අවස්ථාවක සංවර්ධන අවශ්‍යතාවයක වෙනුවෙන් අදාල ස්ථානය තාවකාලික බදුකරුවිසින් කඩා ඉවත් කර ගත යුතුයි. ඒ සඳහා වන්දි මුදලක් ගෙවනු නොලැබේ. බදුකරු කඩා ඉවත්කර නොගන්නේ නම් සභාව විසින් ඉවත් කිරීම පිළිගණිමි.

**10.** වරින් වර බිබිල ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන නීති හා නියෝග පිළිපැදීමට බැඳී සිටියි.

**11.** පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාරයට අදාල ව්‍යාපාර බද්ද බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුයි.

**12.** බිබිල ප්‍රාදේශීය සභාවේ අනුමත වෙළඳ භාණ්ඩ විකිණිය යුතු අතර, නීති විරෝධි කිසිම ද්‍රව්‍යක් ලගතාබා ගැනීම හා අලෙවිකිරිම සිදුනොකල යුතුය.

**13.** ඉහත සඳහන් කොන්දේසි හෝ බිබිල ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පනවනු ලබන නීති හා නියෝග කඩ කළ අවස්ථාවක ආරක්ෂිත ඇප තැන්පත් මුදල සභාව සතුකර කිසියම් කල් දීමකින් තොරව තාවකාලික බද්ද අවලංගු කරනු ලැබේ.

**14.** බිබිල ප්‍රාදේශීය සභාව මඟින් සලකුණු කරලද ලද සීමාවෙන් පිටත (ස්ථානයෙන් පිටත) වෙළදාම පිණිස හෝ වෙනත් කවර කරුණක් සඳහා වෙළඳ භාණ්ඩ, ද්‍රව්‍ය හා උපකරණ තබා නොගත යුතුය.

මෙම ගිවිසුවේ සඳහන් කොන්දේසි කියවා බල තේරුම් ගෙන දෙපාර්ශවය විසින් අත්සන් කළේ වර්ෂ ........................ ක්වූ ............................................ මස ............................. දින බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

බදුකරුගේ අත්සන :-..........................................................................
නම :-..........................................................................
ලිපිනය :-..........................................................................
:-..........................................................................
පු.ලි.දෙ.අංකය :-..........................................................................

**01.** සාක්ෂි :-..........................................................................
නම :-..........................................................................
ලිපිනය :-..........................................................................
:-..........................................................................
පු.ලි.දෙ.අංකය :-..........................................................................

**02.** සාක්ෂි :-..........................................................................
නම :-..........................................................................
ලිපිනය :-..........................................................................

:- ..............................................................................
පු.ලි.දෙ.අංකය :-...............................................................................

ජී.ජී.ආර්. සිල්වා
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ඒ.බී. ප්‍රසංග නලීන කුමාර
සභා ලේකම්,
බිබිල ප්‍රාදේශීය සභාව.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.13. හිඟ කඩකාමර කුලී මුදල් අය කර ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අය විය යුතු කුලී මුදල් අය කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ දී ආදායම් පරීක්ෂක මහතාට මුදල් නොගෙවන ලද අයගෙන් කුලී මුදල් අය කිරීම සඳහා 2022.02.17 දිනැතිව ලිපි මඟින් දැනුවත් කරන ලදී.මෙම කුලී මුදල් ගෙවීම සඳහා 2022.03.16 දින දක්වා කාලය ලබා දී ඇත.2022.03.16 දින වන විට කුලී මුදල් ගෙවා නොමැති අයගේ බදු ගිවිසුම අවලංගු කර 2022.03.25 දින එම කඩ කාමර මුද්‍රා තැබීම සඳහාත්, කුලී මුදල් නොගෙවන අයගෙන් කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.14. නව වෙළඳ සංකීර්ණය අංක 01,03 හා 11 කඩ කාමර සඳහා නව කුලී මුදල තක්සේරු කිරීම සම්බන්ධවයි.**

නව වළඳ සංකීර්ණයේ අංක 01,03 හා 11 කඩ කාමර 2021 නොවැම්බර් මස සිට ප්‍රසම්පාදන මඟින් බදු ලබා දී ඇත. මෙම කඩ කාමර සඳහා කුලී මුදල් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විසින් 2021.02.08 දිනැතිව ලබා දී ඇති තක්සේරු වාර්තාව අනුව රු 18500.00 ක කුලී මුදලක් අය කරන ලදී. නමුත් ඔවුන් විසින් ගෙවන ලද කී මනි මුදල අනුව

නව තක්සේරු මුදල රු 1000.00 (රු එක්දහසක් ) ලෙස සංශෝධනය කර ඇත.මෙම නව තක්සේරු මුදල අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කඩකාමරය ඉදිරිපිට වීදුරු දමා සකස් කිරිමට අමතරව රු.1,000.00ක මුදලක් ගෙවීමට කඩකාමරහිමියන් මීට පෙර පොරොන්දු වී සිටි බැවින් එම මුදලත් සමඟ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ මුදල වන රු.1,000.00ක මුදලත් අය කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කඩකාමරය ඉදිරිපිට වීදුරු දමා සකස් කිරිමට අමතරව රු.1,000.00ක මුදලක් ගෙවීමට එම කඩකාමරහිමියන් මීට පෙර පොරොන්දු වී සිටි බැවින් එම මුදලත් සමඟ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කළ මුදල වන රු.1,000.00ක මුදලත් අය කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.15. වාර්ෂිකව බදු ලබා දී ඇති දේපල සඳහා කුලී මුදල් අය කර ගැනීම සම්බන්දවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු සභා දේපල 2022 වර්ෂයට බදු දීමට අදාලව 2022 ජනවාරි මස බදුකරුවන් විසින් බදු මුදල් ගෙවා ඇත. 2022 පෙබරවාරි මාසයට අදාල බදු මුදල් පෙබරවාරි මස 28 දින වන විට ගෙවිය යුතුය. එම දිනට බදු මුදල් නොගෙවන බදුකරුවන්ගේ බදු මුදල් අය කර ගැනීම සඳහා සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්ම අනුව බදු මුදල් නොගෙවන බදුකරුවන් ආදායම් පරීක්ෂක මහතා විසින් ක්ෂේත්‍රයේ දී දැනුවත් කිරීමටත්, දැනුවත් කිරීමේ පසු මුදල් නොගෙනවන අයට පෙබරවාරි කුලී මුදල් ගෙවන ලෙස 2022.03.04 දිනැති ව ලිපි මඟින් දැනුවත් කිරීමටත්, කුලී මුදල් ගෙවිම සඳහා 2022.03.22 දින දක්වා කාලය ලබා දීමටත් ඒ වන විටත් කුලී මුදල් නොගෙවනන්නේ නම්, 2022.03.23/24 දිනැතිව බදු ගිවිසුම අවලංගු කරන බවට බදුකරු දැනුවත් කර 2022.03.25 දින කුලී මුදල් නොගෙවන ලද බදුකරුවන්ගේ දේපල මුද්‍රා තැබීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16.රු.1000.00ට වඩා වැඩියෙන් ජල ගාස්තු ගෙවීමට ඇති ජල පාරිභෝගිකයින්ගේ ජල සම්බන්ධතා විසන්ධි කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රමවල මාස 03ක ජල ගාස්තු රු.1000.00ට වඩා වැඩියෙන් ගෙවීමට ඇති ජල පාරිභෝගිකයින්ට ජල ගාස්තු ගෙවා අවසන් කරන ලෙස ලිපි මඟින් දන්වා ඇත. එම පාරිභෝගිකයින් විසින් නියමිත දිනට හිඟ මුදල් ගෙවා නොමැති වූ විට ඒ අයගේ ජල සම්බන්ධතා විසන්ධි කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය නොවූ දේපල සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් දේපල 2022 වර්ෂයට බදු දීමට අදාල ව 2022.02.07 දින සිට 2022.02.18 දින දක්වා ප්‍රසම්පාදන කැඳවන ලදී. ඉදිරිපත් වූ ප්‍රසම්පාදන අයදුම්පත් අතර මස් මාළු වලින් තොර ගබඩාවක්, අංක 02 කුකුළු මස් වෙළඳසැල හා අංක 03 කුකුළු මස් වෙළඳසැල බදු ගැනීම සඳහා කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බැවින් මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම දේපල සඳහා ඉදිරිපත් කළ අවම ලංසුව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | ප්‍රසම්පාදනය කළ දේපල | 2022 අවම ලංසුව |
|---|---|---|
| 01 | මස් මාළු වලින් තොර ගබඩාවක් | 50,000.00 |
| 02 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | 250,000.00 |
| 03 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 250,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බි. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මස් මාළු වලින් තොර ගබඩාව එළවළු කඩ කාමරයක් බවට පත් කර දැනට පවත්වාගෙන යනු ලබන කුකුළු මස් වෙළඳසැල් සඳහා 2022 අවම ලංසු මුදලට 5% ක් අඩු කර නැවත ප්‍රසම්පාදනය කිරිමටත් සාකච්ඡා විය. එම බදු මුදල පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රසම්පාදනය කළ දේපල | 2022 අවම ලංසුව | 2022 අවම ලංසුව 5% |
|---|---|---|---|
| 01 | එළවළු කඩ කාමරයක් | 50,000.00 | 50,000.00 |
| 02 | අංක 02 කුකුළු මස් වෙළඳසැල | 250,000.00 | 237,500.00 |
| 03 | අංක 03 කුකුළු මස් වෙළඳසැල | 250,000.00 | 237,500.00 |

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මස් මාළු වලින් තොර ගබඩාව එළවළු කඩ කාමරයක් බවට පත් කර දැනට පවත්වාගෙන යනු ලබන කුකුළු මස් වෙළඳසැල් සඳහා 2022 අවම ලංසු මුදලට 5% ක් අඩු කර නැවත ප්‍රසම්පාදනය කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. 2021 දෙසැම්බර් මස කුලිය අඩුකර ගැනීම.

බිබිල ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සංගමය විසින් බදු ගෙන සිටි බස් නැවතුම්පොල පොදු වැසිකිලිය අලුත් වැඩියා කිරිම හේතුවෙන් දෙසැම්බර් මස වසා තැබූ බව දන්වන ලදී. එම නිසා සුභසාධක සංගමයට බදු මුදල් ලැබී නොමැති බැවින් දෙසැම්බර් මස කුලිය අඩු කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.19. දොඩම්ගාල්ල කඩ කාමර සඳහා 2021 වර්ෂයේ බදු මුදල් ගෙවීම සම්බන්ධවයි.

බිබිල, දොඩම්ගොල්ල ලිපිනයේ පදිංචි ගරු ඒ.එම්.සුදුනිලමේ අත්තනායක මැතිතුමා විසින් 2021 වර්ෂයට අදාල බදු මුදල් ගෙවීමේ දී කොරෝනා වසංගතය හේතුකොටගෙන වර්ෂයේ වැඩි දිනක් දොඩම්ගොල්ල කඩ කාමර වසා තැබීම හේතුවෙන් ගෙවීමට ඇති මුදලින් අඩක් අය කර ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති අතර එය සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කොරෝනා වසංගතය හේතුවෙන් වෙළඳසැල වසා තැබීම නිසා සම්පූර්ණ මුදල කපා හැරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කොරෝනා වසංගතය හේතුවෙන් වෙළඳසැල වසා තැබීම නිසා සම්පූර්ණ මුදල කපා හැරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.20. අවුරුදු මේලා ප්‍රචාරක වැඩසටහන සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීම සම්බන්ධවයි.</u>

2022.04.01 දින සිට 2022.04.12 වන දින දක්වා අවුරුදු මේලා වෙළඳ දැන්වීම ප්‍රචාරණය කොවිඩ් වසංගතය පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2022.04.01 දින සිට පෙ.ව.8.00 සිට ප.ව.8.00 දක්වා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් එය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී උසාවියට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බාධාවක් නොවන ලෙස ප්‍රචාරණ කටයුතු පවත්වාගෙන යාමටත් අවම මුදල රු.20,000.00කට ප්‍රසම්පාදනය කිරීමටත් එහිදී වැඩිම මුදලට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුට ලබා දීමටත් 2022.04.05 දින සිට 2022.04.12 දක්වා සතියකට ප්‍රචාරණ කටයුතු කර ගෙන යාමට අවසර ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

උසාවියට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බාධාවක් නොවන ලෙස ප්‍රචාරණ කටයුතු පවත්වාගෙන යාමටත් අවම මුදල රු.20,000.00කට ප්‍රසම්පාදනය කිරීමටත් එහිදී වැඩිම මුදලට ඉල්ලුම් කරන ඉල්ලුම්කරුට ලබා දීමටත් 2022.04.05 දින සිට 2022.04.12 දක්වා සතියකට ප්‍රචාරණ කටයුතු කර ගෙන යාමට අවසර ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.21. ඇස්තමේන්තු අනුමත කිරීම.

සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය, වැසිකිලි පද්ධති හා ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයෙහි කාර්යාලය වැඩිදියුණු කිරීම සඳහා සකස් කර ඇති පහත ඇස්තමේන්තු අනුමත කිරීම සුදුසු බවත් සභාවේ අරමුදල් ප්‍රමාණය සලකා බලා ඉදිකිරීම් කටයුතු සඳහා ගිවිසුම් ගත වීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේනතු මුදල (රු) |
|---|---|---|
| 01 | පොදු වෙළඳපොල සංකීර්ණයේ වැසිකිලි පද්ධතියේ අප ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සෙප්ටික් ටැංකියක් මිල දී ගෙන සවි කිරීම. | 100,000.00 |
| 02 | කොටගම පල්ලේඅරාව මාර්ගයේ බෝක්කුවක් ඉදිකිරීම. | 350,000.00 |
| 03 | කෙහෙල් අත්තාවෙල මැදකුරගම්මන හෙල කුඹුරේ අසල පෙට්ටි බෝක්කුව සකස් කිරීම. | 250,000.00 |
| 04 | කනුල්වෙල කදිරාදෙන මාර්ගයේ පැති බැම්ම සැකසීම. | 750,000.00 |
| 05 | ඉලුකාපතන දිග්ගල රූන මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම. | 350,000.00 |
| 06 | ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ කාර්යාලය හා සේවක විවේකාගාරය ඉදිකිරීම. | 2,900,500.00 |
| 07 | ඝණ අපද්‍රවය මධ්‍යස්ථානයේ වැසිකිලිය ඉදිකිරීම | 210,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.22. ගලිබවුසරය ධාවනය සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ ඇති ගලිබවුසරයේ ධාරිතාව පිටුපස රෝදවලට දරාගත නොහැකි බැවින් වීල් ඇණ කැඩීම සහ නිතර පැච් යැමට ලක් වේ මෙහි ධාරිතාව අධික බැවින් තනි ටයර් වලට ඔරොත්තු නොදෙන තත්වයක් ඇත.එම නිසා පිටුපස ඩබල් වීල් කර ගැනීමට අවශ්‍ය බැවින් උපරිමය රු.200,000.00කට යටත්ව එහි අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරීම.

වාර්තා කිසිවක් ඉදිරිපත් වී නොමැත.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

2022 ජනවාරි මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

<u>ආදායම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 6,054,618.37** |
| මූලධන ලැබීම් | **-** රු. 6,786,156.19 |
| **ප්‍රාග්ධන ලැබීම්** | **-** රු. - |
| වෙනත් ලැබීම් | - රු. 710,231.03 |
| මුළු ලැබීම් | - රු **13,551,005.59** |

<u>වියදම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 4,376,363.83 |
| ප්‍රාග්ධන වියදම් | - රු. - |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු 3,795,325.97 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු **8,171,689.80** |

**<u>2021.01.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය</u>**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 7,873,361.83 |
| අක්කර බදු | - රු. 5,415.68 |
| ජල ගාස්තු | - රු 550,842.25 |
| කුලී මුදල් | - රු 2,475,343.38 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 5,152,491.05 |
| එකතුව | - රු 16,057,454.19 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

### 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

එච්.එම්. සරත් කුමාර මැතිතුමා වෛද්‍ය හේතූන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇත. එසේම ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය, ඒ.එම්. නදීශා ජයමිණි ගුණසේකර මැතිතුමිය, එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය හා ඩී.එම්. කරුණාවතී මැතිතුමිය යන අය ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පවත්වන ලද වැඩසටහනට ලද ආරාධනය පරිදි සහභාගී වූ නිසා මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව දන්වා ඇති අතර ඒ සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුණු එකතු නොකරන බවටත් පොදු වෙළඳපොල අසල වැසිකිලිය උතුරා යන නිසා ප්‍රදේශය පුරා දුගඳ පැතිර යාම පිළිබඳ ප්‍රාදේශීය සභාවට චෝදනාවක් ඇති බැවින් එය මගහරවා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා</u>**

ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා පිළිතුරු කථාව කරමින් ගරු බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් පවසන ලද කාරණය සම්බන්ධව ගැටලුවක් ඇති බවත් එහි දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුණු කවලම් කර ලබා දීම නිසා ගැටලුවක් ඇති වූ බවත් ඒ පිළිබඳව ඔවුන්ව දැනුවත් කර ඇති නිසා එම ගැටළුව විසඳාගෙන ඇති බවත් නගර සීමාව තුල කුණු රාත්‍රී කාලයේ දී එකතු කරන බැවින් එම කාර්යාලය වසා තිබීමත් ගැටලුවක් වී ඇති බැවින් ඒ පිළිබඳවද ඔවුන්ව දැනුවත් කර මුරකරු හරහා අදාල කසල ලබා ගැනීමට කටයුතු කර ඇති බවත් පොදු වෙළඳපොල සංකීර්ණයේ වැසිකිලි පද්ධතියේ අප ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සෙප්ටික් ටැංකියක් මිල දී ගෙන සවි කිරීමට කටයුතු සිදු කර ඇති බැවින් මෙම ගැටලු විසඳෙන බව ප්‍රකාශ කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.
මීළඟ මාසික සභාව 2022 මාර්තු මස 22 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව
බිබිල

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.